ජාතික ක්‍රීඩා අරමුදල
தேசிய விளையாட்டு நிதியம்
NATIONAL SPORTS FUND

# වාර්ෂික වාර්තාව 2023
# வருடாந்த அறிக்கை 2023
# ANNUAL REPORT 2023




තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் விவகார மற்றும் விளையாட்டு அமைச்சு
Ministry of Youth Affairs and Sports

## පටුන



| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම | 02 |
| 02 | දැක්ම,මෙහෙවර | 02 |
| 03 | ක්‍රීඩා අරමුදලේ කාර්යභාරය | 03 |
| 04 | නීතිමය පසුබිම | 03 |
| 05 | ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම | 04 |
| 06 | ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 05 |
| 07 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 06 |
| 08 | වෙනත් වියදම් | 06 |
| 09 | කෘතඥතාව | 07 |
| 10 | ජාතික ක්‍රීඩා අරමුදලේ විගණිත මූල්‍ය ප්‍රකාශ | 08-27 |
| 11 | විගණකාධිපති වාර්තාව | 28-35 |

# ජාතික ක්‍රීඩා අරමුදල

# වාර්ෂික වාර්තාව - 2023

## හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම,ක්‍රීඩා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුණු කර ගෙන ක්‍රීඩා අරමුදල පිහිටුවා ඇති අතර එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදලේ කාර්යයන් කර ගෙන යන ලදි.

## දැක්ම

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.

## ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්ය භාරය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට සම්බන්ධිත මානව සම්පත් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ භෞතික හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබාදීම සිදු කරනු ලබයි.

වර්තමානයේ ක්‍රීඩා අරමුදල මඟින් මතු සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

එනම් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ වෙනුවෙන් ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් වෙත අනුමත කර ඇති නිර්ණායකයන් යටතේ ගෙවීම් කිරීම, හඳුනාගත් නිර්ණායකයන් යටතේ මාසිකව ක්‍රීඩකයන් සඳහා සිදු කරන පෝෂණ දීමනා ගෙවීම්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් නිර්දේශිත විශේෂිත ඉල්ලීම් සඳහා දෙනු ලබන දීමනා, ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කරනු ලබන ගෙවීම්, විශේෂිත වූ ක්‍රීඩා උත්සව සඳහා සිදු කරන තිළිණ ප්‍රදානයන්,හා විශේෂිත ප්‍රදානයන් (එනම් විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සඳහා සිදු කරනු ලබන ක්‍රීඩා උත්සව වෙනුවෙන් ගෙවීම්, ක්‍රීඩකයන් විශ්‍රාම යාමේදී/ක්‍රීඩාවෙන් සමුගැනීමේ දී සිදු කරන ගෙවීම්, විශේෂිත ක්‍රීඩා උපකරණ ඉල්ලීම් සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය විදේශීය තරඟ වෙනුවෙන් විවිධ කණ්ඩායම් සඳහා කරන දීමනා ගෙවීම්, සානුකම්පිත හේතූන් මත ක්‍රීඩාවට සම්බන්ධ වූ පුද්ගලයන්ට සිදු කරන කරුණා සහගත ගෙවීම් හා ක්‍රීඩාවේ සංවර්ධනය අපේක්ෂිතව සිදු කරනු ලබන වෙනත් ගෙවීම් වේ).

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරනු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරීම හා සංවර්ධනය සඳහා ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරීම සඳහා ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්ය සඳහා ද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

**ජාතික ක්‍රීඩා අරමුදල සඳහා අරමුදල් ලැබීම**

2023.12.31 දිනට අවසන් වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදල සඳහා විවිධ මාර්ග වලින් ලැබීම්වල සමස්ථ එකතුව රු. 292,151,224.00 ක් වන අතර එය පහත පරිදි වේ.

| අනුක්‍රමික අංකය | මාර්ගය | ලද මුදල (රු.) |
|---|---|---|
| 1 | රජයේ ප්‍රදාන | 27,000,000.00 |
| 2 | ජාතික ලොතැරැයි මණ්ඩලය මගින් | 166,557,412.00 |
| 3 | ස්ථාවර තැන්පතු පොළිය | 12,569,258.00 |
| 4 | අනුග්‍රහක ලැබීම් | 77,061,000.00 |
| 5 | වෙනත් ආදායම් | 8,963,554.00 |
| | එකතුව | **292,151,224.00** |

**ජාතික ක්‍රීඩා අරමුදලින් සිදු කල වියදම්**

2023 අරමුදලේ මූල්‍ය ප්‍රකාශණ අනුව ජාතික ක්‍රීඩා අරමුදලින් ගෙවීම්වල සමස්ථ එකතුව රු.256,122,857.00 කි.ප්‍රධාන වශයෙන් ජාතික ක්‍රීඩා අරමුදල මගින් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන්,දේශිය හා විදේශිය තරගාවලි සඳහා,තරග ජයග්‍රහන වෙනුවෙන් මූල්‍ය ප්‍රදානයන් සිදු කිරිම,පුහුණුකරුවන් වෙනුවෙන් දීමනා ගෙවීම, ජාත්‍යන්තර පදක්කම්ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා දිවියෙන් සමු ගැනීම වෙනුවෙන් මූල්‍යම තිළිණ ලබා දීම වැනි ගෙවීම් සිදු කර ඇති අතර එම ගෙවීම් විස්තර පහත දක්වා ඇත.

**ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම**

ශ්‍රී ලංකා නාමය ජාත්‍යන්තර තලයට රැගෙන යාම හා ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් කරන ලද අමිල මෙහෙවර උදෙසා ජාත්‍යන්තර පදක්කම්ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා දිවියෙන් සමු ගැනීම වෙනුවෙන් මූල්‍ය තිළිණ ලබා දී ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 4,300,000.00 |
| | එකතුව | **4,300,000.00** |

**ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම**

2023 වර්ෂයේදී දේශිය තරඟාවලි සංවිධානයට හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වීමට ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය ලබා දී ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | දේශිය තරඟාවලි | 9,581,548.00 |
| 2. | ජාත්‍යන්තර තරඟාවලි | 54,539,895.00 |
| | **එකතුව** | **64,121,443.00** |

**පදක්කම් ලාභීන් හා පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම**

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා හා නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් ලබා ගත් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහන වෙනුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා මුදල් ආධාර ලබා දෙන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගාවලිය හා ලෝක ශූරතා පැරා මලල ක්‍රීඩා තරගාවලිය සඳහා සහභාගිවී ලබා ගත් තරඟ ජයග්‍රහන වෙනුවෙන් මූල්‍ය ප්‍රදානයන් ලබා දෙන ලදී.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | තරඟ ජයග්‍රාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් සඳහා ගෙවීම් | 22,875,000.00 |
| | **එකතුව** | **22,875,000.00** |

**ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම**

2023 වර්ෂයේදී ගරු ක්‍රීඩා අමාත්‍යතුමා වෙත ලැබෙන ඉල්ලීම් අනුව ක්‍රීඩාවේ දියුණුව හා සංවර්ධනය වෙනුවෙන් ක්‍රීඩා උපකරණ ලබා දීම,ක්‍රීඩා පිටි සංවර්ධනය හා වෙනත් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් සඳහා ක්‍රීඩා සමාජ,පාසල්,ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා වෙනත් පාර්ශ්ව වෙත ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය ලබා දී ඇති අතර සමස්ථ වියදම පහත පරිදි වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | 132,956,048.00 |
| | **එකතුව** | **132,956,048.00** |

### පුහුණු කරුවන් වෙනුවෙන් දීමනා ලබා දීම

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනය කරමින් ක්‍රීඩා ක්ෂේත්‍රය ඉහල නැංවීම වෙනුවෙන් සිදු කරන දායකත්වය වෙනුවෙන් පුහුණුකරුවන් සඳහා දීමනා ලබා දි ඇත.එම විස්තර පහත පරිදි වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | පුහුණු කරුවන් සඳහා දීමනා ගෙවීම් | 3,000,000.00 |
| 2. | පුහුණු කරුවන් සඳහා වෙනත් වියදම් | 275,000.00 |
| | **එකතුව** | **3,275,000.00** |

### පරිපාලන හා වෙනත් වියදම්

2023 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලේ පරිපාලනමය කටයුතු උදෙසා වැයවන වියදම් දැරීම හා අභියාචනා උපදේශන කමිටුව මගින් කරන ලද සේවය උදෙසා ගෙවීම් කිරීමත්, ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයින්ගේ මාසික දීමනාව ලබාදීමත් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත සිදු කර ඇති අතර අරමුදලින් දරන ලද වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | පරිපාලන වියදම් | 556,219.00 |
| 2 | අභියායචනා උපදේශන කමිටුව | 6,929,667.00 |
| 3 | ජාතික ක්‍රීඩා සභාව | 1,125,000.00 |
| 4 | විගණන ගාස්තු | 209,760.00 |
| 5 | ජාතික ක්‍රීඩා සංගම් වියදම් | 8,250,000.00 |
| 6 | පුහුණුලාභි දීමනා | 13,334.00 |
| 7 | වෙනත් | 11,511,386.00 |
| | **එකතුව** | **28,595,366.00** |

# කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ පාලනය හා පරිපාලනය සඳහා විධාන ලබා දෙමින් එහි පරිපාලනයට මා වෙත දැක්වූ සහයෝගයට ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාට කෘතඥතාව පලකරමි. එමෙන්ම ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කලමණාකරණයට හා ගිණුම් තැබීම වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරීන්ගේ කැපවීම සහ අරමුදලේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.මහේසන්
ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2023 | | සටහන | තත්‍ය 2023 | 2022 |
|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | - |
| 144,000,000 | 1- රජයේ ප්‍රදාන | 3.1 | 193,557,412 | 119,063,017 |
| 57,000,000 | 2 - ආයෝජන | 3.2 | 12,569,258 | 1,291,057 |
| 90,000,000 | 3 - වෙනත් ආදායම් | 3.3 | 86,024,554 | 279,618,089 |
| **291,000,000** | මුළු ආදායම් ලැබීම් | | 292,151,224 | 399,972,163 |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - |
| - | 4 - තැන්පතු | | - | 330,000 |
| | වෙනත් ලැබීම් | | | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් | | - | **330,000** |
| **291,000,000** | මුළු ආදායම් ලැබීම් සහ | | **292,151,224** | **400,302,163** |
| | අඩුකළා : වියදම් | | | |
| - | පුනරාවර්තන වියදම් | | | |
| - | 5.1. - ආයෝජන | | | |
| 89,000,000 | 6.1. - ක්‍රීඩා තරඟ | 4.1 | 86,996,443 | 201,148,519 |
| 19,075,000 | 6.2. - සුභසාධන දීමනා | 4.2 | 19,071,400 | 3,895,904 |
| 153,000,000 | 6.3. - සංවර්ධන ව්‍යාපෘති | | 132,956,048 | |
| - | 6.4. - හැකියා වර්ධනය | 4.3 | - | 300,000 |
| 17,400,000 | 6.5 - පරිපාලන වියදම් | 4.4 | 17,098,966 | 1,767,475 |
| **278,475,000** | මුළු පුනරාවර්තන වියදම් | | **256,122,857** | **207,111,898** |
| | මුළු වියදම් | | 256,122,857 | 207,111,898 |
| | 2023 දෙසැම්බර් 31 දිනට | | | |
| 12,525,000 | අතිරික්තය/ ඌණතාවය | | 36,028,367 | 193,190,265 |

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2023 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන ගිණුම | 5 | 47,194,271 | 91,938,363 |
| මුදල් ශේෂය | 6 | 30,980,703 | 67,307,526 |
| විවිධ ණය ගැතියෝ | 7 | 213,033,742 | 95,724,700 |
| මුළු වත්කම් | | 291,208,715 | 254,970,589 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සමුච්චිත අරමුදල | 8 | 290,826,955 | 254,798,589 |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ තැන්පත් | 9 | | - |
| උපචිත වියදම් | 10 | 381,760 | 172,000 |
| ජංගම වගකීම් | | 381,760 | 172,000 |
| මුළු වගකීම් | | 291,208,715 | 254,970,589 |

පිටු අංක…01…….සිට …03…… දක්වා ආකෘතිපත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු පිටු අංක ……04…. සිට ……20…. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

…………………………………
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/02/2024

…………………………………
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 27/02/24

ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල
## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | 36,028,367 | 193,190,265 |
| | 36,028,367 | 193,190,265 |
| ආයෝජන පොලි අධි ගණනය කිරීම | | |
| විගණන ගාස්තු අධි වෙන්කිරීම් | | |
| මුදල් නොවන වෙනස්වීම | - | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| ණය ගැතියෝ අඩුවීම/වැඩිවීම | (117,309,042) | 65,453,803 |
| විවිධ තැන්පතු වැඩිවීම/වැඩිවීම | - | (330,000) |
| විවිධ ණය හිමියෝ අඩුවීම/වැඩිවීම | 209,760 | 37,503 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (117,099,282) | 65,161,306 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පත් ආයෝජනය වැඩිවීම/ස්ථාවර තැන්පත් මුදල් කිරීම | 44,744,092 | (75,849,304) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 44,744,092 | (75,849,304) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | (36,326,823) | 51,519,656 |
| කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 67,307,526 | 15,787,870 |
| කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 30,980,703 | 67,307,526 |

එස්. මහේෂන්
ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ
අංක.09, ෆිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/02/2024

..........................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 28/02/24

ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## 2 ගිණුම් සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය,ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත

### 2.2 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### 2.3 වාර්තාකරණ කාල පරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයට අදාල වාර්තා කරන කාලපරිච්ඡේදය වේ.

### 2.4 මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ අගයන් සංසන්දනාත්මකව නැවත ගැලපීම

2022 වර්ෂයට අදාලව හඳුනාගන්නා ලද වෙනස්කම් 2022 වර්ෂයේ ගිණුම්වලට සංසන්දනාත්මකව ගැලපීම සිදුකර නැවත ප්‍රකාශිත කර ඇත.

### 2.5 උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

## 3 ආදායම් ලැබීම් සඳහා සටහන්

### සටහන් 03.1 - රජයේ ප්‍රදාන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2023 | 2022 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 1 | | රජයේ ප්‍රදාන | | |
| 1 | 1 | ප්‍රදාන | 27,000,000 | 29,050,967 |
| 1 | 2 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 166,557,412 | 90,012,050 |
| 1 | 3 | වෙනත් | | |
| | | | **193,557,412** | **119,063,017** |

### සටහන් 03.2 - ආයෝජන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2023 | 2022 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 2 | | ආයෝජන | | |
| 2 | 1 | ස්ථාවර තැන්පතු | | |
| 2 | 2 | ස්ථාවර තැන්පතු පොළී | 12,569,258 | 1,291,057 |
| | | | **12,569,258** | **1,291,057** |

### සටහන් 03.3 - වෙනත් ආදායම්

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2023 | 2022 නැවත ප්‍රකාශිත ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 3 | | වෙනත් ආදායම් | | |
| 3 | 1 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | අනුග්‍රාහක ලැබීම් | 77,061,000 | 279,561,638 |
| 3 | 3 | වෙනත් ආදායම් හා ගැලපීම් | 8,963,554 | 56,452 |
| | | | **86,024,554** | **279,618,090** |

### සටහන් 03.4 - තැන්පතු

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2023 | 2022 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 4 | | තැන්පතු | | |
| 4 | 1 | තැන්පතු ලැබීම් | | 330,000 |
| 4 | 2 | වෙනත් | | |
| | | | - | **330,000** |

## 4 වියදම් සඳහා සටහන්

### සටහන් 4.1 - ක්‍රීඩා තර්ඟ

| වියදම් සංකේතය | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම රු.ශත | 2022 වියදම රු.ශත |
|---|---|---|---|---|---|
| 6 | 1 | | ක්‍රීඩා තරඟ | | |
| 6 | 1 | 1 | දේශීය තරඟාවලි | 9,581,548 | 38,943,300 |
| 6 | 1 | 2 | ජාත්‍යන්තර තරඟ | 54,539,895 | 79,053,719 |
| 6 | 1 | 3 | පුහුණුකරු | 22,875,000 | 83,151,500 |
| | | | | **86,996,443** | **201,148,519** |

### සටහන් 4.2 - සුභසාධන දීමනා

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම රු.ශත | 2022 වියදම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 2 | | | සුභසාධක දීමනා | | |
| 6 | 2 | 1 | | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා | | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 2,601,004 |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 4,300,000 | 700,000 |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 11,496,400 | 594,900 |
| | | | | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | - |
| | | | | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | - |
| | | | | ක්‍රීඩකයින් සඳහා උපහාර | | - |
| 6 | 2 | 2 | | පුහුණුකරුවන් සඳහා | | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 3,000,000 | - |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 275,000 | |
| | | | | | **19,071,400** | **3,895,904** |

### සටහන් 4.3 - සංවර්ධන ව්‍යාපෘති

| වියදම් සංකේතය | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම රු.ශත | 2022 වියදම රු.ශත |
|---|---|---|---|---|---|
| 6 | 3 | | සංවර්ධන ව්‍යාපෘති | | |
| 6 | 3 | 1 | ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘති | 132,956,048 | 150,000 |
| 6 | 3 | 2 | වෙනත් සංවර්ධන ව්‍යාපෘති | - | 150,000 |
| | | | | **132,956,048** | **300,000** |

සටහන් 4.4 - හැකියා වර්ධනය

| වියදම් සංකේතය | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම රු.ශත | 2022 වියදම රු.ශත |
|---|---|---|---|---|---|
| 6 | 4 | | කාර්යසාධනය | | |
| 6 | 4 | 1 | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | - | 150,000 |
| 6 | 4 | 2 | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | - | 150,000 |
| 6 | 4 | 3 | නිලධාරින්ගේ හැකියා වර්ධනය | - | |
| | | | | **-** | **300,000** |

සටහන් 4.4 - පරිපාලන වියදම්

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම | 2022 වියදම |
|---|---|---|---|---|---|---|
| | | | | | රු.ශත | රු.ශත |
| 6 | 5 | | | පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | | පොදු පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 556,219 | 183,000 |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 209,760 | 361,818 |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | - | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 14,986 | 547,490 |
| 6 | 5 | 2 | | ක්‍රීඩා පරිපාලන වියදම් | | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 6,929,667 | 209,500 |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 1,125,000 | 415,667 |
| 6 | 5 | 2 | 3 | ජාතික ක්‍රීඩා පදනම/සංගමය | 8,250,000 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුකරුවන් සඳහා ගෙවීම් | 13,334 | 50,000 |
| | | | | | **17,098,966** | **1,767,475** |

## 5 ආයෝජන

| විස්තරය | 2023 | 2022 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| ආරම්භක ශේෂය | 91,938,363 | 16,089,059 |
| වර්ෂයේ එකතුකිරීම් | | 75,000,000 |
| වර්ෂයේ ඉවත්කිරීම් | (50,000,000) | - |
| පොලිය | 5,255,908 | 849,304 |
| අවසාන ශේෂය | **47,194,271** | **91,938,363** |

## 6 මූල්‍ය ප්‍රවාහ සඳහා සටහන්

| විස්තරය | 2023 | 2022 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| ආරම්භක ශේෂය | 67,307,526 | 15,787,870 |
| වර්ෂයේ ලැබීම් | 219,586,274 | 333,669,056 |
| වර්ෂයේ ගෙවීම් | 255,913,097 | 282,149,401 |
| අවසාන ශේෂය | **30,980,703** | **67,307,526** |

## 7 විවිධ ණයගැතියෝ

### සටහන් 7.1 - ජාතික ලොතරැයි මණ්ඩලය

| විස්තරය | 2023 | 2022 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| ආරම්භක ශේෂය | 94,433,643 | 29,421,593 |
| වර්ෂයේ ආදායම | 166,557,412 | 90,012,050 |
| ගැලපීම් | - | - |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් | 50,000,000 | 25,000,000 |
| අවසාන ශේෂය | **210,991,055** | **94,433,643** |

### සටහන් 7.2 - ස්ථාවර තැන්පතු පොලී

| විස්තරය | 2023 | 2022 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| ආරම්භක ශේෂය | 1,291,057 | 849,304 |
| වර්ෂයේ පොලිය | 12,569,258 | 1,341,810 |
| වර්ෂයේ ඉවත්කිරීම්/ | 11,817,628 | |
| අවසාන ශේෂය | **2,042,687** | **1,291,057** |

## 8 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | 2023 | 2022 නැවත ප්‍රකාශිත |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| 2023.01.01 දිනට සමුච්චිත අරමුදල | 254,798,588 | 61,608,323 |
| 2023 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | 36,028,367 | 193,190,265 |
| වෙනත් ගැලපීම් | - | - |
| **2023.12.31 දිනට සමුච්චිත අරමුදල** | **290,826,955** | **254,798,588** |

## 9 විවිධ තැන්පත්

| විස්තරය | 2023 | 2022 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| ආරම්භක ශේෂය | - | 330,000 |
| වර්ෂයේ ලැබීම් | - | - |
| ආදායමට මාරු කිරීම් | - | 330,000 |
| අවසාන ශේෂය | - | - |

## 10 උපචිත වියදම්

| විස්තරය | 2023<br>රු.ශත | 2022<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 172,000 | 209,503 |
| වර්ෂයේ එකතුකිරීම් | 209,760 | 172,000 |
| වර්ෂයේ ගෙවීම් | | 209,503 |
| අවසාන ශේෂය | **381,760** | **172,000** |

.........................................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 28/02/24

**ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා**
**ප්‍රධාන ගණකාධිකාරි**
**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

ඇමුණුම 01

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2023.12.31 දිනෙන් අවසන් දිනට ශේෂ පිරික්සුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තර | ලෙජර් පිටු අංකය | හර | බැර |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | රු. | රු. |
| | | | | සමුච්චිත අරමුදල - 2023.01.01 දිනට | 01 | | 254,798,588 |
| | | | | ආයෝජන ගිණුම | 02 | 47,194,271 | |
| 1 | 1 | | | ප්‍රදාන | 03 | | 27,000,000 |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 04 | | 166,557,412 |
| 1 | 2 | | | ජාතික ලොතැරැයි මණ්ඩලය ආදායම ලැබිය යුතු | 04 | 210,991,055 | |
| 1 | 3 | | | වෙනත් | | | - |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 02 | | 12,569,258 |
| 2 | 2 | | | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 02 | 2,042,687 | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 05 | | 77,061,000 |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 06 | | 8,963,554 |
| 4 | 1 | | | තැන්පතු ගිණුම | 07 | | - |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 08 | 9,581,548 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 09 | 54,539,895 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙ | 10 | 22,875,000 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 11 | - | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 12 | 4,300,000 | |
| 6 | 2 | 1 | 3 | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 13 | 11,496,400 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 14 | 3,000,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 15 | 275,000 | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘති | | 132,956,048 | |
| 6 | 3 | 2 | | වෙනත් සංවර්ධන ව්‍යාපෘති | | - | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 17 | - | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 18 | - | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | 19 | - | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 20 | 556,219 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 21 | 209,760 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු වෙන්කිරීම | 21 | | 381,760 |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 22 | 14,986 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් - ගෙවිය යුතු | 22 | - | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 23 | 6,929,667 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 24 | 1,125,000 | |
| 6 | 5 | 2 | 3 | ජාතික ක්‍රීඩා සංගමය | | 8,250,000 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභින් සඳහා ගෙවීම් | 25 | 13,334 | |
| | | | | මුදල් ශේෂය | | 30,980,703 | |
| | | | | | | | |
| | | | | | | 547,331,573 | 547,331,573 |

.............................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 27/02/24

ඇමුණුම - 02

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| ආදායම් කේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | ලැබීම් 2023 | ලැබීම් 2023 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. |
| | | | | ජනවාරි 01 දිනට ශේෂය | | 67,307,526 |
| 1 | 1 | | | ප්‍රදාන | 27,000,000 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 50,000,000 | |
| 1 | 3 | | | වෙනත් | - | |
| | | | | ස්ථාවර තැන්පතු | 50,000,000 | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 6,561,721 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 77,061,000 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 8,963,554 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | - | |
| 4 | 2 | | | වෙනත් | - | |
| | | | | | | **219,586,274** |
| | | | | ලැබීම් එකතුව | | **286,893,800** |
| **වැය කේතය** | | | | **ගිණුමේ නම සහ විස්තරය** | **2023 ගෙවීම්** | **2023 ගෙවීම්** |
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | - | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 9,581,548 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 54,539,895 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 22,875,000 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | - | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 4,300,000 | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 11,496,400 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 3,000,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 275,000 | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | 132,956,048 | |
| 6 | 3 | 2 | | වෙනත් සංවර්ධන වැඩසටහන් | - | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 4 | 3 | | නිලධාරීන්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 556,219 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | - | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | - | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 14,986 | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 6,929,667 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 1,125,000 | |
| 6 | 5 | 2 | 3 | ජාතික ක්‍රීඩා සංගමය | 8,250,000 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 13,334 | |
| | | | | එකතුව | | **255,913,097** |
| | | | | දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය | - | **30,980,703** |

.........................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

ඇමුණුම - 03

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2023 | ආදායම් 2023 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු | රු |
| | | | | | | |
| 1 | 1 | | | ප්‍රදාන | 27,000,000 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 166,557,412 | |
| 1 | 3 | | | වෙනත් | | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 12,569,258 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 77,061,000 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 8,963,554 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | | |
| 4 | 2 | | | වෙනත් | | |
| | | | | | | |
| | | | | ආදායම් එකතුව | | 292,151,224 |
| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2023 වියදම් | 2023 වියදම් |
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 9,581,548 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 54,539,895 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 22,875,000 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | - | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 4,300,000 | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 11,496,400 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 3,000,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 275,000 | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | 132,956,048 | |
| 6 | 3 | 2 | | වෙනත් සංවර්ධන වියදම් | - | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 4 | 3 | | නිලධාරීන්ගේ හැකියා වර්ධනය | - | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 556,219 | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් ගිණුම | - | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 209,760 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 14,986 | |
| 6 | 5 | 2 | 1 | අභියායවනා උපදේශණ කමිටුව | 6,929,667 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 1,125,000 | |
| 6 | 5 | 2 | 3 | ජාතික ක්‍රීඩා සංගම් ගිණුම | 8,250,000 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභී ගෙවීම් ගිණුම | 13,334 | |
| | | | | | | |
| | | | | එකතුව | | 256,122,857 |
| | | | | අතිරික්තය | - | 36,028,367 |

..............................................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 27/02/24

ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා

ප්‍රධාන ගණකාධිකාරී

ජාතික ක්‍රීඩා අරමුදල

**2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැය විචලතා විශ්ලේෂණය**

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය | වෙනස | වෙනස මූලික වියදම් ඇස්තමේන්තු වේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. | රු. | | |
| | | | | ලැබීම් | | | | | |
| 1 | 1 | | | ප්‍රදාන | 27,000,000 | 27,000,000 | - | - | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 50,000,000 | 50,000,000 | - | - | |
| 1 | 3 | | | වෙනත් | 67,000,000 | 67,000,000 | - | - | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු | 50,000,000 | 50,000,000 | - | - | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 7,000,000 | 6,561,721 | 438,279 | 6 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | - | - | - | - | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 80,000,000 | 77,061,000 | 2,939,000 | 4 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 10,000,000 | 8,963,554 | 1,036,446 | 10 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | | - | - | - | |
| 4 | 2 | | | වෙනත් | | | - | - | |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව | තත්‍ය | වෙනස | වෙනස මූලික වියදම් ඇස්තමේන්තු වේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. | රු. | | |
| | | | | ගෙවීම් | | | | | |
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | - | - | - | - | |
| 5 | 2 | | | වෙනත් ආයෝජන | - | - | - | - | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 10,000,000 | 9,581,548 | 418,452 | 4 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 56,000,000 | 54,539,895 | 1,460,105 | 3 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 23,000,000 | 22,875,000 | 125,000 | 1 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | - | - | - | - | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 4,300,000 | 4,300,000 | - | - | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 11,500,000 | 11,496,400 | 3,600 | 0 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 3,000,000 | 3,000,000 | - | - | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 275,000 | 275,000 | - | - | |
| 6 | 2 | 2 | 3 | වෙනත් | - | - | - | - | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | 153,000,000 | 132,014,838 | 20,985,162 | 14 | අපේක්ෂිත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක නොවීම. |
| 6 | 3 | 2 | | වෙනත් සංවර්ධන වියදම් | | - | - | - | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | - | - | - | - | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | - | - | - | - | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | - | - | - | - | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 600,000 | 556,219 | 43,781 | 7 | අපේක්ෂිත පරිදි දීමනා සංශෝධනයක් සිදු නොවීම. |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 100,000 | - | - | - | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | - | - | - | - | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 50,000 | 14,986 | 35,014 | 70 | අපේක්ෂා කල පරිදි වියදම් අවශ්‍යතා ජනිත නොවීම. |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශක කමිටුව | 7,000,000 | 6,929,667 | 70,333 | 1 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 1,300,000 | 1,125,000 | 175,000 | 13 | අවශ්‍යතා සීමා වීම. |
| 6 | 5 | 2 | 3 | ජාතික ක්‍රීඩා සංගමය | 8,300,000 | 8,250,000 | 50,000 | 1 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුකරුවන් සඳහා ගෙවීම | 50,000 | 13,334 | 36,666 | 73 | අපේක්ෂිත පරිදි බැරකම් ඉදිරිපත් නොවීම. |

..........................................
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 27/2/24

**ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා**
**ප්‍රධාන ගණකාධිකාරී**
**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

සටහන් - 11

ජාතික ක්‍රීඩා අරමුදල

2023.12.31 දිනට විවිධ ණය ගැතියෝ

| 2022<br>රු. ශත | වැය විෂය | | | ගිණුම් සටහන් සහ විස්තර | ගිණුම් සටහන් | 2023<br>රු. ශත |
|---|---|---|---|---|---|---|
| 1,291,057.00 | 2 | 2 | | ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොළී | 16 | 2,042,687 |
| | | | | | | - |
| 94,433,643 | 1 | 2 | | ලැබිය යුතු ජාතික ලොතැරැයි මණ්ඩල ආදායම් | 14 | 210,991,055 |
| | | | | | | - |
| 95,724,700 | | | | එකතුව | | 213,033,742 |

..........................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 28/02/24

**ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා**
ප්‍රධාන ගණකාධිකාරී
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

සටහන් - 12

ජාතික ක්‍රීඩා අරමුදල

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| 2022 රු. ශත | ගිණුමේ නම සහ විස්තරය | 2022 රු. ශත |
|---|---|---|
| | | |
| 61,608,323 | 2023.01.01 දිනට සමුච්චිත අරමුදල | 254,798,588 |
| | | |
| | | |
| 193,190,265 | 2023 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | 36,028,367 |
| | | |
| | | |
| 254,798,588 | 2023.12.31 දිනට සමුච්චිත අරමුදල | 290,826,955 |

.......................................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 23/02/24

ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා

ප්‍රධාන ගණකාධිකාරි

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

සටහන් - 13

ජාතික ක්‍රීඩා අරමුදල

2023.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

ලොතැරැයි ආදායම - ගි.අංක 041 සහ ලැබිය යුතුලොතැරැයි ආදායම - ගි අංක. 017

2023 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයෙන් රු. 50,000,000.00 ක් ලැබී ඇති අතර 2023.12.31 දින වන විට මේ සඳහා තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල රු. 210,991,054.97 කි.

2023 වර්ෂයේ ලොතැරැයි ආදායම

| 2023.01.01 දිනට ආරම්භක ශේෂය | | 94,433,642.97 |
|---|---|---|
| මාසය | මාසයට අදාල මුදල රු. ශත | |
| ජනවාරි | 13,063,070.00 | |
| පෙබරවාරි | 13,124,120.00 | |
| මාර්තු | 15,950,410.00 | |
| අප්‍රේල් | 12,258,150.00 | |
| මැයි | 12,217,450.00 | |
| ජූනි | 17,804,046.00 | |
| ජූලි | 15,238,100.00 | |
| අගෝස්තු | 13,531,440.00 | |
| සැප්තැම්බර් | 13,704,850.00 | |
| ඔක්තෝබර් | 12,846,460.00 | |
| නොවැම්බර් | 12,577,454.00 | |
| දෙසැම්බර් | 14,241,862.00 | |
| 2023 වර්ෂය සඳහා අයවිය යුතු මුදල | | 166,557,412.00 |
| මුළු අයවිය යුතු මුදල | | 260,991,054.97 |
| අඩු කළා- භාණ්ඩාගාරයෙන් ලැබීම් | | 50,000,000.00 |
| 2023.12.31 දිනට අවසන් ශේෂය | | 210,991,054.97 |

.............................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 25/02/24

ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

සටහන් - 14

ජාතික ක්‍රීඩා අරමුදල

**2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු වියදම්**

| අනු අංකය | ගෙවිය යුතු අයගේ නම | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | විගණකාධිපති | 2022 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කිරීම | 172,000.00 |
| 2 | විගණකාධිපති | 2022 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කිරීම | 209,760.00 |
| | එකතුව | | **381,760.00** |

..............................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 23/02/24

**ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා**
**ප්‍රධාන ගණකාධිකාරි**
**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

සටහන් - 16

## ජාතික ක්‍රීඩා අරමුදල

### 2023.12.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි

ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි -

| ගිණුම් අංකය | ස්ථාවර තැන්පතුව ආරම්භක දිනය | අවසන් වරට ආයෝජනය අලුත් කල දිනය | අවසන් වරට ආයෝජනය කල්පිරීමට නියමිත දිනය | කාලය | සිට | දක්වා | දින ගණන | පොලිය ගණනය කළ ආකාරය: ආයෝජන මුදල පොලිය සහිතව | පොලිය ගණනය කළ ආකාරය: පොළී අනුපාතය | 2023 වර්ෂයට අදාල පොලිය (රදවා ගැනීමේ බදු අඩු කිරීමට පෙර) | රදවා තබා ගැනීමේ බද්ද 5% | ශුද්ධ පොළී මුදල | 2023 වර්ෂය සඳහා ලද පොලිය | 2023 වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 78404430 | 2015.12.30 | 2023.01.03 | 2024.01.03 | අවු. 01 | 2023/01/01 | 2023/12/31 | 362 | 8,911,696.46 | 12.00% | 1,060,613.96 | 53,030.70 | 1,007,583.26 | | 1,007,583.26 |
| 78404516 | 2015.12.30 | 2023.01.03 | 2024.01.03 | අවු. 01 | 2023/01/01 | 2023/12/31 | 362 | 8,911,696.46 | 12.00% | 1,060,613.96 | 53,030.70 | 1,007,583.26 | | 1,007,583.26 |
| 90054788 | 2022.12.23 | 2023.12.27 | 2024.03.27 | මාස 03 | 2023/01/01 | 2023/03/23 | 82 | 25,000,000.00 | 26.00% | 1,460,273.97 | 73,013.70 | 1,387,260.27 | | |
| | | | | | 2023/03/23 | 2023/06/23 | 92 | 26,522,602.27 | 20.00% | 1,337,029.81 | 66,851.49 | 1,270,178.32 | | |
| | | | | | 2023/06/23 | 2023/09/25 | 94 | 27,792,780.60 | 13.00% | 930,487.07 | 46,524.35 | 883,962.71 | | |
| | | | | | 2023/09/25 | 2023/12/27 | 93 | 28,676,743.31 | 10.00% | 730,667.71 | 36,533.39 | 694,134.32 | 4,235,535.63 | |
| | | | | | 2023/12/27 | 2023/12/31 | 4 | 29,370,877.63 | 9.00% | 28,968.54 | 1,448.43 | 27,520.11 | | 27,520.11 |
| 90054780 | 2022.12.23 | | 2023.04.24 | මාස 01 | 2023/01/01 | 2023/01/23 | 23 | 25,000,000.00 | 26.00% | 409,589.04 | 20,479.45 | 389,109.59 | | |
| | | | | | 2023/01/23 | 2023/02/23 | 31 | 25,524,451.59 | 13.50% | 292,657.07 | 14,632.85 | 278,024.21 | | |
| | | | | | 2023/02/23 | 2023/03/23 | 28 | 25,802,475.80 | 13.50% | 267,214.68 | 13,360.73 | 253,853.95 | | |
| | | | | | 2023/03/23 | 2023/04/24 | 32 | 26,056,329.75 | 13.50% | 308,392.72 | 15,419.64 | 292,973.09 | | |
| | | | | | 2023/04/24 | 2023/05/24 | 30 | 26,349,302.84 | 19.00% | 411,482.26 | 20,574.11 | 390,908.15 | 1,604,868.99 | |
| 90054792 | 2022.12.23 | | 2023.06.23 | මාස 06 | 2023/01/01 | 2023/06/23 | 174 | 25,000,000.00 | 26.00% | 3,098,630.14 | 154,931.51 | 2,943,698.63 | | |
| | | | | | 2023/06/23 | 2023/12/27 | 187 | 28,079,040.63 | 12.75% | 1,834,176.78 | 91,708.84 | 1,742,467.94 | 4,686,166.58 | |
| එකතුව | | | | | | | | 47,194,270.55 | | 13,230,797.71 | 661,539.89 | 12,569,257.82 | 10,526,571.19 | 2,042,686.63 |

.........................................
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 27/02/24

**ඩබ්. පී. ඩී. එම්. ජේ. පෙරේරා**
**ප්‍රධාන ගණකාධිකාරී**
**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } SYA/A/NSF/6/23/20 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 ඔක්තෝම්බර් 07 දින

ලේකම්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1971 අංක 38 දරන මුදල් පනත සහ ජාතික රජය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 26 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ක්‍රීඩා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අවස්ථා දෙකකදී අරමුදලෙන් රු. 2,793,176 ක් වරායෙන් ක්‍රීඩා භාණ්ඩ නිදහස් කර ගැනීම සහ ක්‍රීඩකයින්ට හා නිලධාරීන්ට ජාත්‍යන්තර තරඟාවලියක් සඳහා සහභාගී වීමට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මුදල් ලබාදී තිබුණ ද එම මුදල් ලැබිය යුතු ශේෂයක් ලෙස දැක්වීම වෙනුවට අරමුදලේ වියදම් ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ

විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය | ජාතික ක්‍රීඩා අරමුදල සම්බන්ධයෙන් එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් විසින් පිළියෙළ කළ යුතු වුවද, 2023 වර්ෂය සඳහා එවැනි වාර්තාවක් වාර්තාවේ දින දක්වා පිළියෙළ කර නොතිබුණි. |
| ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877 (1) ඡේදය (ආ) | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව 2023 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදන කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

2.3.1 ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවීමේ පරමාර්ථය හා කාර්යසාධනය

(අ) 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 22 වන වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවා තිබුණ ද මූලා ප්‍රකාශනවල අරමුදලේ ප්‍රධාන අරමුණු ලෙස හඳුනාගෙන තිබුණේ වාර්ෂික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීමයි. එබැවින්, අරමුදල විසින් එකී ප්‍රධාන කාර්යයන් හා අරමුණු නිසි ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) අරමුදල පිහිටුවා වසර 51 ක් ගතවී තිබුණ ද ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මට්ටමින් ඔලිම්පික් ක්රීඩා උළෙලවල් 20 කදී ඔලිම්පික් පදක්කම් 02 ක් ද පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟවලදී රිදී පදක්කම් 03 ක් සහ ලෝකඩ පදක්කම් 08 ක් ද ආසියානු ක්‍රීඩා උළෙලයන්හිදී රන් පදක්කම් 02 ක්, රිදී පදක්කම් 03 ක් සහ ලෝකඩ පදක්කම් 02 ක් පමණක් ජයග්‍රහණ කර තිබුණි.

(ඇ) 2023 වර්ෂයේ අරමුදලේ අයවැය මගින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ දීමනා, පුහුණුකරුවන්ගේ වියදම් හා කාර්යමණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම සඳහා පිළිවෙලින් රු. 5,000,000, 200,000 හා 1,000,000 වෙන් කර තිබුණද එයින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

2.3.2 ක්‍රීඩා අරමුදලේ අරමුණුවලින් පරිබාහිර කටයුතු සඳහා වැය කිරීම.

(අ) නීතිපති දෙපාර්තමේන්තුව විසින් නීතිඥ සහාය ලබාදෙන බව දන්වා සිටියදීත් සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යවරයා විසින් හා ක්‍රීඩා අමාත්‍යවරයාට එරෙහිව පවරන ලද නඩු 06 කට අදාළව එකතුව රු. 8,250,000 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි.

(ආ) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවෙන්, ජාතික ක්‍රීඩා සභාවෙන්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ජාතික ක්‍රීඩා සංගමය විසින් නිර්දේශ ලබාදී නොතිබුණු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත BWF ලෝක ප්‍රවීණයන්ගේ බැට්මින්ටන් ශූරතාවලිය - 2023 ට සහභාගී වීම සඳහා රු. 500,000 ක් ලබාදී තිබුණි.

**2.3.3 කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු**

(අ) ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 104.7 ක් විවිධ පාර්ශවයන් වෙත ලබා දී තිබුණ අතර ඒ සඳහා සකස් කර තිබුණු ඇස්තමේන්තු මත අත්තිකාරම් ලබා දී වැඩ අවසන් අදියර අනුව වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට ඇස්තමේන්තුගත කර තිබුණු මුළු මුදලම ව්‍යාපෘතිය වෙත නිදහස් කර තිබුණි. ඉහත පරිදි ලබා දී තිබුණු මුදලට අදාළව සිදු කළ යුතු කාර්යයන් සඳහා නිශ්චිත කාල රාමුවක් හඳුන්වාදීමෙන් එම කාලය තුළ අදාල ඉදිකිරීම් නිමකල බවට තහවුරුවක් ද ලබාගෙන නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 90 ක වටිනාකමින් ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 07 ක භෞතික ප්‍රගතිය සියයට 0 සිට 60 දක්වා පරාසයක පැවති අතර, ඉතිරි ව්‍යාපෘති සාර්ථකව නිමකළ බවට ඉංජිනේරුවරයකු විසින් සහතිකයක් ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් ලබාදී තිබුණු මුදල් උක්ත ව්‍යාපෘතිය සඳහා යොදවා ගත්තේ ද යන්න හා එකී ව්‍යාපෘති වෙත නිදහස් කර තිබුණු මුදලට සරිලන ප්‍රතිලාභ ලබාගෙන තිබුණේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරයේ ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රීඩා අරමුදල මගින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.9,157,992 ක් 2020 ජූලි 20 දින ලබාදී තිබුණි. ලබා දී තිබුණු මුදලින් 2022 ජනවාරි 12 දින වන විට රු.7,265,483 ක් පමණක් වියදම් කර, ඉතිරි මුදල වන රු.1,892,509 ක මුදල 2022 ජනවාරි සිට 2024 අගෝස්තු දක්වා වසර දෙකකට වඩා වැඩි කාලයක් ගතවීමෙන් පසුවද අරමුදල වෙත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) ක්‍රීඩක ක්‍රීඩකාවන් හා පුහුණුකරුවන් සඳහා ආධාර හා අනුග්‍රහයන් ලබාදීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර එය අනුගමනය කිරීම වෙනුවට ඔවුන් විසින් අරමුදල වෙත කරන ඉල්ලීම් මත මුදල් නිදහස් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පමණක් රු. මිලියන 11 ක මුදලක් එලෙස ඔවුන් වෙත ලබා දී තිබුණ අතර එම මුදල් නිශ්චිත අරමුණු සඳහා යොදවා ගත්තේ ද යන්න පිළිබඳ පසුවිපරමක් ද අරමුදල මගින් සිදුකර නොතිබුණි. තවද, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු තරගාවලින් සොයා බලා ඒ සඳහා ආධාර හා අනුග්‍රහයන් දැක්වීම වෙනුවට අවිධිමත් පරිදි එම ක්‍රියා සිදුවී තිබුණි.

(ආ) ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම විනිවිදභාවයකින් යුක්තව සිදු වී නොතිබුණ අතර විගණන නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වූ කරුණු අනුව එක් අවස්ථාවකදී නිදහස් කර තිබුණු රු. 4,484,293 ක මුදලක් උපයෝජනය කරමින් ගුවන් ටිකට්පත් 09 ක් මිලදී ගැනීමේදී තරඟකාරී මිල කැඳවීමක් මත අවම පිරිවැයක් දරා ගුවන් ටිකට්පත් මිලදී ගෙන නොතිබුණි.

(ඇ) අවස්ථා 38 ක දී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළුව වෙනත් ආයතන හා පාර්ශවයන් වෙත විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු. 23,690,647 ක් අදාළ කාර්යයන් සඳහා යොදවා ගත්තේ ද යන්න තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීමෙන් බලාපොරොත්තු වූ කාර්යන් ඉටු වී තිබුණේ ද යන්න නිශ්චිත කිරීමට නොහැකි විය.

**2.3.5 අරමුදල් කළමණාකරණය**

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ සේවක සුබසාධක සංගමයේ මෙහෙයවීමෙන් ජාතික ක්‍රීඩා අරමුදලට රු. 5,000,000 ක ආධාර එකතුකිරීමේ අරමුණින් 2023 වර්ෂයේදී RISE 2023 යන නමින් සංගීත ප්‍රසංගයක් පවත්වා තිබුණ ද එම ප්‍රසංගය සඳහා ලද ආදායම හා දරන ලද වියදම පිළිබඳ ගිණුම් ප්‍රකාශයක් ලබා දී නොතිබුණ අතර අරමුදලට ලැබීමට තිබුණු දායකත්වය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති